සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | නැටුම් (දේශීය) I පත්‍රය<br>நடனம் (சுதேச) வினாத்தாள்-1<br>Dancing (Oriental) Paper I | පැය එකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>One Hour |

- අංක 01 සිට 40 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 26-40 දක්වා ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාල කොටස තෝරා ගන්න.

01. 'කඳුරු ගසක් ගෙන නියමෙට මේලෙස ගැනපන්' මෙම කවිය ගායනය කරනු ලබන්නේ
 1. ගොයම් නැටුමේදී ය. 2. මෝල්ගස් නැටුමේදී ය.
 3. කුළු නැටුමේදී ය. 4. සවරං නැටුමේදී ය.

02. ජීවන වෘත්තීන් හා බැඳුනු ගැමි ගායනා විශේෂයකි.
 1. කළගෙඩි කවි 2. තාලම් කවි
 3. ලී කෙළි කවි 4. පතල් කවි

03. කෝළම් නාටකයේ දී රඟමඩල හඳුන්වන නාමය වන්නේ
 1. කරළිය 2. කමත
 3. තානායම් පොළ 4. මඩුව

04. ප්‍රශස්ති කාව්‍ය රචනා බිහි වූ යුගය ලෙස සැලකෙන්නේ
 1. දඹදෙණිය යුගය 2. කෝට්ටේ යුගය
 3. පොළොන්නරු යුගය 4. මහනුවර යුගය.

05. ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් ප්‍රචාරය කෙරෙන ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි.
 1. ගුවන් විදුලිය 2. පුවත්පත්
 3. රූපවාහිනිය 4. සඟරා

06. පංචතූර්ය වාදනයේ දී ආතත හා විතත කොටසට අයත් වන්නේ
 1. දවුල හා තම්මැට්ටම
 2. උඩැක්කිය හා තම්මැට්ටම
 3. පන්තේරුව හා තම්මැට්ටම
 4. හොරණෑව හා තම්මැට්ටම

07. කෝළම් උපත අනුව ප්‍රථම කෝළම් නාටකය පවත්වන ලද්දේ
 1. මහ සම්මත රජුගේ බිසවගේ දොළදුක සංසිඳවීම පිණිසය.
 2. මහා පරාක්‍රමබාහු රජුගේ බිසවගේ දොළදුක සංසිඳවීම පිණිසය.
 3. ආයුපාල කුමරියගේ දොළදුක සංසිඳවීම පිණිසය
 4. සංඛපාල රජුගේ බිසවගේ දොළදුක සංසිඳවීම පිණිසය


299

08. මාත්‍රා 12 + 12 + 1234 යන තිත් රූපය හඳුන්වන නාමය වනුයේ

1. දෙසුළු මහ තුන් තිත ය.
2. තුන් සුළු මහ තිත ය.
3. සුළු මහ තිත ය.
4. දෙසුළු මහ දෙතිතය.

09. රස නිෂ්පත්තිය සිදුවන නර්තනාංග සහ නාට්‍යමය පෙළපාළි වැඩිපුර දක්නට ඇත්තේ කුමන නර්තන සම්ප්‍රදායේ ද ?

1. උඩරට නර්තන සම්ප්‍රදාය
2. පහතරට නර්තන සම්ප්‍රදාය
3. සබරගමු නර්තන සම්ප්‍රදාය
4. ද්‍රවිඩ නර්තන සම්ප්‍රදාය

- අංක 10 සිට 14 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත වගුව උපයෝගි කරගන්න.

| පේළිය | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | මලය රජු | පඬුවස් දෙව්රජු | කුවේණි | සේරමාන් රජු |
| 2 | දවුල | තම්මැට්ටම | 1978 | හොරණෑව |
| 3 | ක්‍රෝධ | 2005 | භය | පූනාමඩුව |
| 4 | ගරාමඩුව | පහන් මඩුව | පත්තිනිදේවිය | විෂ්ණු දෙවි |
| 5 | 1972 | විරමුණ්ඩ දෙවි | ගම්භාර දෙවි | 1943 |
| 6 | කොහොඹා කංකාරිය | අද්භූත | ගැටබෙරය | උත්සව |

10. කොහොඹා කංකාරිය , දෙවොල් මඩුව හා සම්බන්ධ ප්‍රධාන රජවරුන් දෙදෙනා ඇතුළත් වන්නේ

1. 1 පේළියේ A තීරුවේ හා D තීරුවේය.
2. 1 පේළියේ A තීරුවේ හා B තීරුවේය.
3. 1 පේළියේ B තීරුවේ හා C තීරුවේය.
4. 1 පේළියේ B තීරුවේ හා D තීරුවේය.

11. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය හා පුද ලබන දෙවියන් සඳහන් වී ඇත්තේ

1. 1 පේළියේ A තීරුවේ සහ B තීරුවේය.
2. 4 පේළියේ B තීරුවේ සහ C තීරුවේය.
3. 6 පේළියේ A තීරුවේ සහ D තීරුවේය.
4. 3 පේළියේ D තීරුවේ සහ C තීරුවේය.

12. අතීතයේ සන්නිවේදන කාර්යය සඳහා යොදා ගත් වාද්‍ය භාණ්ඩය සඳහන්ව ඇත්තේ

1. A තීරුවේය.
2. B තීරුවේය.
3. C තීරුවේය.
4. D තීරුවේය.

13. වීර රසයට මුල්වන ස්ථායිභාවය සඳහන්ව ඇත්තේ

1. A තීරුවේය
2. B තීරුවේය.
3. C තීරුවේය.
4. D තීරුවේය.

14. සෞන්දර්යය අධ්‍යාපන ආයතනය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූ වර්ෂය සඳහන්ව ඇත්තේ

1. A තීරුවේ ය
2. B තීරුවේ ය.
3. C තීරුවේ ය.
4. D තීරුවේ ය.

15. කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා හඳුන්වනු ලබන්නේ

1. පොන්නානී නමිනි
2. ශිංකිඩි නමිනි
3. චක්කියාර්වරු නමිනි
4. ආසන් නමිනි

16. කථකලි නර්තනය උගන්වන ප්‍රධාන ආයතනය කුමක් ද?

1. ශාන්ති නිකේතනය
2. භාත්ඛණ්ඩේ විශ්ව විද්‍යාලය
3. කේරළ කලා මණ්ඩලම්
4. ලලිත කලා විශ්ව විද්‍යාලය

17. මුද්‍රා නාටකයක කථාව විකාශනය වනුයේ

1. නර්තනය හා සංගීතය තුළිනි.
2. දෙබස් හා සංවාද තුළිනි.
3. සංගීතය හා දෙබස් තුළිනි.
4. ගීත හා නාට්‍ය මගිනි.

18. වන්නි ප්‍රදේශවල සොකරි නාටකය රඟදැක්වීමේ දී වාදනය කරනු ලබන්නේ

1. උඩරට ගැටබෙරයයි
2. දවුලයි
3. උඩැක්කියයි
4. තම්මැට්ටමයි

19. මෙවා උඩරට වන්නම් 18 ට අයත් වේ.

1. ගජගා , තුරගා , මයුරා , ඊරඩි
2. ගජගා , තුරගා , මයුරා , විරාඩි
3. ගජගා, තුරගා , මයුරා , කුදිරඩි
4. ගජගා , තුරගා , තිසරා , ඊරඩි

20. නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට සහ මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට කටයුතු කළ ශිල්පිනියන් දෙදෙනෙකි.

1. මිරැන්ඩා හේමලතා මහත්මිය සහ වජිරා චිත්‍රසේන මහත්මිය.
2. චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය සහ වජිරා චිත්‍රසේන මහත්මිය.
3. උපේඛා චිත්‍රසේන මහත්මිය සහ මේරියන් පීරිස් මහත්මිය
4. චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය සහ රජිනි සෙල්වනායගම් මහත්මිය

21. ශ්‍රී ලංකාවේ පවතින නර්තන සම්ප්‍රදායන් අතුරෙන් විවිධ වූ රංග වස්ත්‍රාභරණ දක්නට ලැබෙන්නේ

1. භාරත නාට්‍ය සම්ප්‍රදායේය
2. උඩරට නර්තන සම්ප්‍රදායේය
3. පහතරට නර්තන සම්ප්‍රදායේය
4. සබරගමු නර්තන සම්ප්‍රදායේය

22. ගොයම් නැටුම හා සම්බන්ධ සුවිශේෂී වාද්‍ය භාණ්ඩයක් වන්නේ

1. ගැටබෙරය
2. තම්මැට්ටම
3. බුම්මැඩිය
4. රබාන

23. මුද්‍රා නාට්‍යයක දක්නට නොලැබෙන අභිනය වන්නේ

1. ආංගික අභිනයයි
2. වාචික අභිනයයි
3. සාත්වික අභිනයයි
4. ආහාර්ය අභිනයයි

24. 'කරදිය' හා ' නළ දමයන්ති 'මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ

1. එස්. පණිභාරත මහතා විසිනි
2. ප්‍රේමකුමාර මහතා විසිනි
3. චිත්‍රසේන මහතා විසිනි
4. වසන්ත කුමාර මහතා විසිනි

25. කෙනෙකුගේ මුළු ශරීරය විහිදුවා ලබාගත හැකි ඉඩ ප්‍රමාණය හඳුන්වන්නේ

1. පොදු අවකාශය නමිනි.
2. පුද්ගල අවකාශය නමිනි.
3. මෝස්තර නිර්මාණ නමිනි.
4. රටා හා හැඩතල නමිනි.

## 11 කොටස

## උඩරට කොටස

26. සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

1. සත් කෝරළය , සතර කෝරළය සහ මහනුවර වේ.
2. සත් කෝරළය , සතර කෝරළය සහ පස්දුන් කෝරළය වේ.
3. සතර කෝරළය , තුන් කෝරළය සහ පස්දුන් කෝරළය වේ.
4. සතර කෝරළය , හාරිස්පත්තුව සහ හල්පිට කෝරළය වේ.

27. මාත්‍රා 3 + 4 තිත් රූපයට අයත් වන්නමකි.

1. සිංහරාජ වන්නම
2. මුසලඬි වන්නම
3. සැවුලා වන්නම
4. ගජගා වන්නම

28. කොහොඹා කංකාරි ශාන්ති කර්මයට අයත් පුරාවෘත්තයේ දැක්වෙන චරිත වන්නේ

1. සේරමාන් රජු සහ විජය රජු ය.
2. පත්තිනි දේවිය සහ සේරමාන් රජු ය.
3. විජය රජු සහ පඬුවස් දෙව් රජු ය.
4. පත්තිනි දේවිය සහ පඬුවස් දෙව් රජු ය.

29. ගැටබෙරයෙන් වාදනය කරන දෙවන බෙර සරඹ පදය වනුයේ

1. තකට කුදට
2. තකට තකට
3. තකට තකට කුදු
4. තකට ජිකට

30. කුඳංත ගත දොං වට්ටම නටනු ලබන්නේ


1. මාත්‍රා 12/1234 දෙ තිතටය.
2. 12/12/123 තුන් තිතටය.
3. 1234 / 1234 තනි තිතටය.
4. 12 / 12 / 1234 තුන් තිතටය.

31. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනය සහිත නර්තන අංග දෙකකි.

1. අස්නේ සහ කොහොඹා හැල්ල
2. දුනුමාල්පපුව සහ කොහොඹා හැල්ල
3. දුනුමාලප්පුව සහ කෝල්පාඩුව
4. අස්නේ සහ කෝල්පාඩුව

32. උඩරට නර්තනය හා බැඳි නාට්‍යමය පෙළපාළි දෙකකි.

1. පුදා වැඩීම සහ ගුරුගේ මාලාව
2. යක්කම් සහ ගුරුගේ මාලාව
3. යක්කම් සහ මළයරාජ කතාව
4. මුවමල විදීම සහ මලයරාජ කතාව




දී ඇති රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

33 A අකුරෙන් දක්වෙන්නේ ගැටබෙරයේ

1. කැපුම් හම 2. බෙර ලණුව 3. බෙර ගැටිය 4. බෙර කඳ

34. B අකුරෙන් දක්වෙන ගැටබෙර ඇසේ විෂ්කම්භය කොපමණ ද ?

1. රියනකි 2. විග්ගුස්සයි 3. අඟුලකි 4. රියනකි

35. ' නොනැවත යනු නැත එතනින් ' මෙම කවියේ ඉතිරි කොටස වන්නේ

1. දුටත් යනෙන විටත් දුවන පිටත් පොට ගසා පනිමින
2. හිරුත් අවර ගිරත් පැමිණි කලක් වසන තැනින් දුවන
3. ගමනක් යන විලසක් ගෙන ඉසිඳුන් දෙව්කළ සතොසින
4. විටත් ඔවුන තුටත් සිතින මහත් සමගියෙන් දුව පැන

36. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික වචන වේ.

1. කස්තිරම , සීරුමාරුව , අඩව්ව
2. සීරුමාරුව , හමාර පදය , ආරම්භක පදය
3. පා සරඹ , සුරල් , වට්ටම්
4. ගොඩ සරඹ , කස්තිරම , සීරුමාරුව

37. මෙය මාත්‍රා 3 තනිතිතට අයත් බෙර පදයකි.

1. දොං දොජිං ජිං ගත ජිංකුද
2. දොමිත දොමිත දොං දොමිකිට කිට දොං
3. ජිං කඩකත ජිං කුඳ කුඳ
4. ජිං කඩ කඩකත තක්කිට තරිකිට

38. වන්නම්වල අර්ථය දෙස බැලීමේ දී ඒවා ප්‍රථමයෙන් රචනා වී ඇත්තේ

1. නර්තනය සඳහා පමණක් බව පෙනේ.
2. ගායනය කරමින් නර්තනය කිරීමට බව පෙනේ.
3. ගායනය සඳහා පමණක් බව පෙනේ.
4. ඉහත කිසිම දෙයක් සඳහා නොවන බව පෙනේ.

39. මේවා උඩරට වෙස් ඇඳුම් කට්ටලය හා සම්බන්ධ වේ.

1. නෙත්තිමාලය , උරබාහු , අවුල්හැරය
2. ගෙජ්ජි , උරමාලය , වෙස් තට්ටුව
3. බන්දිවළලු , හඟල , සුම්බරය
4. කෙමෙත්ත , කරමාලය , පබළු හැට්ටය

40. 'තත් තොග තක තොග - තක්කඩ තරිකිට තක තොග ' ..................... යන අඩව්වේ මීළඟ පද කොටස වනුයේ

1. තකට කුදට තත් ජික්කඩ තරිකිට
2. තකට ජිකට තොග ජික්කඩ තරිකිට
3. තා කුජිත්තගත දොම්කිට
4. තකට කුදට ජික්කඩ තරිකිට

## 11 කොටස
## පහතරට නර්තන

26. සාම්ප්‍රදායික පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
   1. රයිගම, මාතර සහ බෙන්තර වේ.
   2. රයිගම , හොරණ සහ බදුල්ල වේ.
   3. මාතර , බෙන්තර සහ රත්නපුරය වේ.
   4. මාතර බෙන්තර සහ බළංගොඩ වේ.

27. මාත්‍රා 2 + 2 + 3 තාලයට අයත් සින්දු වන්නමකි.
   1. නාකිලිංචි තාලේ සින්දු වන්නම
   2. ශුද්ධ තාලේ සින්දු වන්නම
   3. නළු ගීතිකා තාලේ සින්දු වන්නම
   4. ලලිත රාග තාලේ සින්දු වන්නම

28. දෙවොල් මඩු ශාන්තිකර්මයට අයත් පුරාවෘත්තයේ සඳහන් චරිත වන්නේ
   1. විජය රජු හා පඬුවස්දෙව් රජුය.
   2. සේරමාන් රජු හා විජය රජුය
   3. සේරමාන් රජු හා පත්තිනි දේවිය.
   4. පත්තිනි දේවිය හා කුවේණිය.

29. පහතරට බෙරයෙන් වාදනය කරන දෙවන බෙරසරඹ පදය වනුයේ
   1. ගුහිති ගහිති  2. ගුහිති ගදිරිකිට
   3. ගුහිති ගුහිති  4. ගුන්ද දෙගත


30. ගුඳ ගති ගත වට්ටම නටනු ලබන්නේ
   1. මාත්‍රා 12 / 1234 දෙතිතටය.
   2. මාත්‍රා 123 / 1234 දෙතිතටය.
   3. මාත්‍රා 1234 / 1234 තනි තිතටය.
   4. මාත්‍රා 12 / 12 තනි තිතටය.

31. දෙවොල් මඩුව ශාන්තිකර්මයේ ගායනය සහිත අංග දෙකකි.
   1. තොරන් යාගය සහ දෙවොල්  2. තොරන් යාගය සහ තෙල්මේ
   3. ගිරිදේවි සහ තෙල්මේ  4. දෙවොල් සහ තෙල්මේ

32. පහතරට නර්තනය හා බැඳි නාට්‍යමය පෙළපාලි වනුයේ

1. මරා ඉපද්දීම හා පොය්කඩේ යක්කම
2. මරා ඉපද්දීම සහ අඹ විදමන
3. අසුර යක්කම සහ අඹ විදමන
4. අසුර යක්කම සහ රාමා යක්කම

- දී ඇති රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.




33. පහතරට බෙරයේ A අකුරෙන් දක්වෙන්නේ

1. කැපුම් හම යි
2. බෙර ලණුව යි
3. බෙර පුහුල ය
4. බෙර කඳ ය

34. B අකුරෙන් දක්වෙන පහතරට බෙර ඇසේ විශ්කම්භය කොපමණ ද ?

1. රියනකි
2. එක් වියත් තුනඟුලකි
3. අඟුලකි
4. වියතකි

35. ' සිරිපිරි ගිරි මුදුනත සුරපුර ලෙසිනා ' ..................... මෙම කවි පදයේ ඉතිරි කොටස වන්නේ

1. සිරිසඳ සමඟ සිරිසඳ සමගිව වෙසෙනා
2. සිරිලක පවර දෙවිනුවරෙහි වෙසෙසවනා
3. සුරිඳුනි අසනු මකියන බස බැති පෙමිනා
4. සිරිකත සේම සිරිසඳ සමගිව වෙසෙනා

36. පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික වචන වේ.

1. ඉරට්ටිය , ඉලංගම් සරඹ , කලාසම
2. දොඹින පද , සුරල , අන්තාඩිය
3. ඉරට්ටිය , බඹර වළල්ල , ගොඩ සරඹ
4. ඉලංගම් සරඹ , අන්තාඩිය , ඉරට්ටිය

37. මෙය මාත්‍රා 3 තනිතිතට අයත් බෙර පදයකි.

1. දොං දොං ගත ගත් දිත ගුං
2. ගුං ගුං දෙගත ගත්ත ගුං
3. ගුංද දෙගත ගති ගත ගුද
4. ගුං ගුං ගදි ගත ගුංද දෙගත ගත

38. සිංදු වත්නම්වල අර්ථය දෙස බැලීමේ දී ඒවා ප්‍රථමයෙන් රචනා වී ඇත්තේ

1. නර්තනය සඳහා පමණක් බව පෙනේ.
2. ගායනය කරමින් නර්තනය කිරීමට බව පෙනේ.
3. ගායනය සඳහා පමණක් බව පෙනේ.
4. ඉහත කිසිම දෙයක් සඳහා නොවන බව පෙනේ.

39. මේවා පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලය හා සම්බන්ධ වේ.

1. තෙල් කච්චිය , හැට්ටය , නළල් පටිය
2. ඉන හැඩය , සිලම්බු , ගෙජ්ජි
3. ජටාව , බන්දිවළලු , ඉන පටිය
4. නෙත්තිමාලය , හැට්ටය , හේලය

40. 'තකදිත් තකදොං කිත්තත් කිටිතක ' ...................... යන ඉරට්ටියේ මීළඟ පද කොටස වනුයේ

1. ගුගුදිත ගත දොං කිටිතත් කිටිගත
2. තරිගත දිකුදොං දොමිත දොමිත ගත
3. දෙගදිත ගත ගුගුදිත ගත
4. ගුහිතිගදිරිකිට කිටිතක් කිටිගුද

The National e-learning Portal for The General Education